# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 195 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 03/02/2024 පැය 1355

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.02.02 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|
| 01 | 01 | 185 | තඹ දඟර 01<br>ප්ලාස්ටික් බැරල් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල ගල්කිරියාගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාස කඳවුර.**

2024.02.02 වන දින සවස් කාලයේ එඬේරමුල්ල පොලිස් වසමේ වත්තල ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මත්කරල් 192,000 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන එඬේරමුල්ල පොලිස් ස්ථානයට භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ බදුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. එඬේරමුල්ල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.



**03.** **හැෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුර.**

2024.02.02 වන දින අළුයම් කාලයේ පේසාලේ පොලිස් වසමේ වංකාලපාඩු ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 610 ක් විද්‍යුත් තරාදි 01 හා ජංගම දුරකථනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පේසාලේ පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ පේසාලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පේසාලේ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර.**

2024.02.02 වන දින උදෑසන කාලයේ ඔකවල පොලිස් වසමේ මෝදරවාන ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඔකවල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වූ මෝදරවාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ඔකවල** පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05.** **නීති විරෝධි ලෙස කළු ගඟේ මැණික් ගරමින් සිටි සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.02.02 වන දින දහවල් කාලයේ රත්නපුර පොලිස් වසමේ කළු ගඟ ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධි ලෙස කළු ගඟ ආශ්‍රිතව මැණික් ගරමින් සිටි පුද්ගලයින් 05 දෙනෙකු එම මැණික් ගැරීමට උපයෝගී කර ගන්නා උපකරණ තොගයක් සමඟ අත්අඩංගුවට ගෙන ඇහැළියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 ත් 51 ත් අතර වයස් වල පසුවන රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.02.02 වන දින දහවල් කාලයේ පිටිගල පොලිස් වසමේ පොල්පැලකැටිය ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර ගිනි අවියකින් අහසට වෙඩි තබා බියගන්වා කෙටේරියකින් පහරදී පුද්ගලයෙකුට පහරදීම සම්බන්ධයෙන් සැකකරුවෙකු මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ අත්අඩංගුවට ගෙන පිටිගල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වූ තල්ගස්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පිටිගල** පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07. බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වච්නතිව් කඳවුර.**

2024.02.02 වන දින සවස් කාලයේ කරදියනාරු පොලිස් වසමේ කිතුල පොතාන ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් සිටි වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කරදියනාරු පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ තන්නාමුනෙයි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ඔකවල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**